# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014 අප්‍රේල් 30 වන බදාදා**
2014 சித்திரை 03 புதன்கிழமை
Wednesday 30th April 2014

**කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කමිටු 'ඒ' කාමරයේදී පැවැති පළාත් සභා රැස්වීම**

கொழும்பு 07, பௌத்தாலோக மாவத்தையில் அமைந்துள்ள பண்டாரநாயக்க ஞாபகார்த்த சர்வதேச மகாநாட்டு மண்டபத்தில் 'ஏ' குழு அறையில் நடைபெற்ற மாகாண சபைக் கூட்டம்

The Provincial Council meeting held at the Committee Room 'A' of the Bandaranaike Memorial International Conference Hall, Colombo 7.

**පූ.භා. 10.56 ට පළාත් සභාව රැස් විය.**
*மு.ப.10.56 க்கு சபை கூடியது*
*The Provincial Council met at 10.56 a.m.*

**ගරු ආණ්ඩුකාරතුමා [සෙයිද් අලවි මව්ලානා මැතිතුමා] මූලාසනාරූඪ විය.**
*கௌரவ ஆளுநர் [ செய்யத் அலவி மௌலானா அவர்கள்] தலைமை வகித்தார்.*
*Hon. Governor [ Mr. Seyd Alavi Mawlana ] chaired*

# පළාත් සභාව කැඳවීමේ ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදනය
## HON. GOVERNOR'S ANNOUNCEMENT FOR SUMMONING THE PROVINCIAL COUNCIL

**හේමන්ත සමරකෝන් මහතා - සභා ලේකම්**
Lalith Kannangara - Secretary of the Council

සුභ උදෑසනක්. ගරු ආණ්ඩුකාරතුමා රැස්වීම කැඳවමින් කරන ලද පහත සඳහන් ප්‍රකාශනය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා.

**ප්‍රකාශනය**

"සියළු දෙනා විසින් මෙයින් දැන ගත යුතුයි :

බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර, සෙයිද් අලවි මව්ලානා වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 'ආ' ව්‍යවස්ථාවේ 8 (අ) ඡේදය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, බස්නාහිර පළාතේ පළාත් සභාව වර්ෂ දෙදහස් දාහතරක් වූ අප්‍රේල් මස 30 වන දින පෙ.ව. 11.15 ට කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ 'A' කමිටු කාමරයේ දී රැස්වීම සඳහා මෙයින් කැඳවමි."

(අත්සන)
සෙයිද් අලවි මව්ලානා,
බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවර.

වර්ෂ දෙදහස් දාහතරක් වූ අප්‍රේල් මස 24 වැනි දින,
කොළඹ 05,
98/4, හැව්ලොක් පාර,
බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ දී ය.

***බස්නාහිර පළාතේ VI වන පළාත් සභාව සඳහා වූ ගරු ආණ්ඩුකාරවරයාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් ගරු ආණ්ඩුකාරතුමා වෙත පිළිගන්වන ලදී.***

*Hon. Governor's policy Statement in respect of the Sixth Provincial Council of the Western Province was presented to the Hon. Governor by the Hon. Chief Minister Prasanna Ranatunga.*

# VI වන පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය
## POLICY STATEMENT OF HON. GOVERNOR FOR THE SIXTH PROVINCIAL COUNCIL

**ගරු අලවි මව්ලානා - ආණ්ඩුකාරතුමා**
Hon. Alavi Mowlana - Governor

සුභ දවසක්. ආයුබෝවන්.

Hon.Chairman, Hon. Chief Minister, Hon. Ministers, Hon. Leader of the Opposition, Hon. Members.

සුභ උදෑසනක්. Good Morning. **வணக்கம்**, **அஸ்ஸலாமு அலைக்கும்**

Hon. Chairman,Hon. Chief Minister,Hon. Ministers, Hon. Leader of the Opposition, Hon. Member,

Good Morning to you all,

I extend my congratulations to all of you who have been selected to this honourable Council by people's mandate, and I am very much pleased to have the

[Hon. Governor]

opportunity to present the first policy statement for the Sixth Provincial Council of the Western Province.

I believe that bringing about progress to the people of the Western Province is the utmost expectation of all of you members. I would like to point out the importance in preparation of suitable plans to achieve a distinctive development in economic, social and cultural aspects of people living in urban, rural and estate sector in Colombo, Gampaha and Kalutara districts in concurrence to the National Programme of Mahinda Chinthana Vision while obtaining the assistance of the institutions of the Central Government further.

The Western Province where more than one fourth of the country's population is living in can be introduced as the forerunner of the total development process of the country. Therein, the Western Provincial Council is expecting to give its maximum contribution to achieve the national targets, specifically for those of which have been given priority within the national development targets, such as; improving per capita income into 4470 $ by 2016 and to 8500$ by 2020, bringing up literacy rate up to 98% by 2016 and up to 100% by 2020, to improve life expectancy at birth up to 86 years for men and 80 years for women.

Policies and programmes to be followed by our Provincial Council for the five year time period of 2014-2019 are extensively presented to you herewith, and I would like to present a summary of it under several sections.

**Education, Local Government, Local Government Roads, Lands**

I expect to bring about a quality development in the education sector through further development of infrastructure related to the education field of the Western Province and through the allocation of physical and human resources. By providing financial, technological, legal assistance to strengthen the 48 local government institutions of the Western Province and to convert those institutions into more attractive places through human resource development as well as to provide assistance to develop all the rural roads that function under the control of local government institutions are expected. Also, I would like to draw into attention about the importance in implementation of a proper waste disposal programme through the coordination of said institutions and by raising awareness in people. Furthermore, implementation of the Provincial Land Statute, establishing an information system related to land disposal according to 'e'- state policy, deployment of state-owned bare lands within the province into productive tasks too are expected.

**Agriculture and Agrarian Development, Minor Irrigation, Industries, Cultural and Arts Affairs**

It is expected to make quality seeds, culture materials and inputs abundant to uplift the agricultural activities of the Western Province. Encouraging urban and rural homestead gardening and commercial fruit cultivation, renovation and maintenance of minor irrigation systems as well as uplifting the paddy cultivation of the province through the re-cultivation of fallow paddy fields too are intended. Similarly, I would pay attention to the formulation of a provincial irrigation statute.

In compliance to the Mahinda Chinthana National Policy, "creating local entrepreneurs with strength to conquer the world based on local resources and indigenous knowledge", Western Provincial handloom industry, coir, clay industry, timber training, electrical technology and computer training centers and Craft Lanka sales centers are expected to be expanded further.

According to the Mahinda Chinthana Policy of "Comfortable satisfactory life style", I would pay attention to formulate policies and plans relevant to environmental conservation.

Likewise, promotion of cultural and artistic heritages that improve mutual correlation among all the ethnic groups and religions of the province too are expected.

**Health, Indigenous Medicine, Probation and Child Care Services**

Based on the Mahinda Chinthana Future Vision, with the expectation of certifying a free health service for all to achieve a healthy tomorrow and with the aim of providing the public with a quality health service in relation to western and indigenous medicine fields, strengthening the family health services by provision of physical, human resources required to the provincial hospitals as well as to establish one Ayurvedic Central Dispensary in each Divisional Secretariat have been targeted.

While paying attention to probation and child care services, future plans will be prepared under the main themes of ensuring the stability of Child Development Centers and socialization of detained children.

**Electricity and Power, Provincial Roads, Housing and Construction, Water Supply and Drainage, Social Welfare, Urban and Estate Sector Infrastructure Facilities**

Conforming to the National Electricity Policy of bring up electricity supply up to 100% level by year 2016, providing every household of the Western Province with electricity and improvement of provincial roads up to 92% level are expected.

Equally, by conforming to the National Water Supply Policy, providing urban and rural people with pure drinking water, preservation of province's water resources programmes and further expansion of community water supply projects will be carried out.

Following the theme of "A society ensured with protection", providing relief to the poor and destitute communities, rehabilitation of refugee and extremely poor families, providing aids to persons suffering from illnesses is expected to be maintained further.

Provision of infrastructure facilities for estate sector houses, provision of Housing Aid, providing solutions to residents living on rent and planning plus implementation of housing schemes for Public Service Officers too are expected to be carried out.

**Transport, Sports and Youth Affairs, Women's Affairs, Fisheries and Tourism Affairs**

I expect to improve the quality status of transport service, providing facilities required by passengers and transport sector employees, implementing running plans and construction of peripheral bus stops that consist of modern facilities with the expectation of providing an efficient transport service. Vehicle Revenue Licenses obtaining facilities are expected to be upgraded into the level of payment of such fees via internet to obtaining the relevant license.

In accordance to the National Policies, I would pay attention to provide physical and financial facilities for the development of Western Provincial sports sector, maintaining and improvement of physical and mental well being of the community, improving sports skills of the sportsmen and sportswomen of the province.

For the women who comprise a majority of the province's population, I expect to economically and socially empower them further through the provision of knowledge, technology and financial strength required by them.

In the same manner, plans will be made for the development of fresh water and brackish water farms, provision of technological knowledge, training and provision of utensils necessary for the fishing industry as well as uplifting of the education of fisheries children will be carried out.

[Hon. Governor]

Through the infrastructure development related to the places of attraction of the province, by upgrading the professional skills, by increasing the standards of institutions providing tourism related services, proliferation of employment opportunities as well as increased income earning are expected.

**Cooperative, Rural Development, Domestic Economic Promotion, Animal Production and Development Affairs**

To provide a better service to consumer public, further promotion of Co-op City, Mini Co-op City, *Osu Sal* (Pharmacies), sales promotion centers is expected and in order to ensure the service security of cooperative employees, further allocation of facilities including the pension is intended.

Moreover, reorganization and strengthening of Rural Development Societies, further expansion of training activities of Rural Women Development Centers too are expected.

Since there is a better mobility within the Western Province in terms of animal production and sales of milk production, chicken, eggs and other animal products, by obtaining the assistance of other officers including the Veterinary Practitioners, I expect further expansion of affairs related to animal control training centers. Through that, proliferation of job opportunities and improvement of nutrition statuses of the public are expected.

Hon. Chairman,

By providing the human resources to implement the aforesaid programmes while stabilizing the faith placed on His Excellency the President and the Government led by him through Provincial Public Service itself, action will be taken in future to provide the relevant human resources through the Provincial Public Service Commission. Similarly, special insurance programme, implemented for the total staff engaged in Provincial Public Service is expected to be strengthened and continued further.

While preserving the policies stated above and in conformation to National Policies and Mahinda Chinthana Future Vision; it is expected to achieve targets and objectives to bring about economic development within the province during the time period of the Sixth Provincial Council where development benefits will be divided among all. Also, introducing programmes centered to Sunday Schools and religious places of worship for the social, cultural, religious and spiritual development of the people of the province too are expected.

When the programmes relevant to the policy statement presented by me are put into practice through the ministries on the guidance of the Board of Ministers including the Hon. Chief Minister, I emphasize the importance of maintaining those programmes under good financial discipline and in a way where maximum benefits are received by the public through trimming off of unnecessary expenses and I stress that, with regard to this matter, it is the responsibility of all of you to take productive criticisms and proposals into discussion at the Ministerial Advisory Committees.

When this Policy Statement was compiled, special attention was paid to the strategic development plan that has been formulated by the Western Provincial Council and I express my thanks to the Chief Secretary, Secretary to the Governor, Secretaries to ministries including the officers for providing me with the necessary data. Also, to all of you who listened to my Policy Statement patiently all this while, I would like to extend my thanks.

S. Alavi Mowlana,
Governor of Western Province Provincial Council

*[ සිංහල පරිවර්තනය]*
*[ SINHALA TRANSLATION ]*

*ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ගරු අමාත්‍යවරුනි, ගරු විපක්ෂ නායකතුමනි, ගරු මන්ත්‍රීතුමනි / තුමියනි,*

*ජනවරමින් මෙම ගරු සභාවට තේරී පත් වූ ඔබ සැමට මගේ සුභ පැතුම් පුද කරන අතර, බස්නාහිර පළාතේ හය වැනි පළාත් සභාවේ ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම අතිශයින්ම සතුටට පත් වෙමි.*

*ඔබ සියලු දෙනාගේම ඒකායන බලාපොරොත්තුව බස්නාහිර පළාතේ ජනතාවගේ දියුණුව සැලසීම යන්න බව මාගේ විශ්වාසයයි. අප පළාතේ ඉදිරි පස් වසර සඳහා ප්‍රතිපත්ති සම්පාදනයේ දී මහින්ද චින්තන ඉදිරි දැක්ම ජාතික වැඩ පිළිවෙළට සමගාමීව මධ්‍යම රජයේ ආයතනවල සහාය තවදුරටත් ලබා ගනිමින් කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන්හී නාගරික, ග්‍රාමීය හා වතු අංශයන්හී ජනතාවගේ ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අංශයන්හී කැපී පෙනෙන වර්ධනයක් අත් කර දීමට සුදුසු සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පෙන්වා දෙමි.*

*ශ්‍රී ලංකාවේ ජනගහණයෙන් ¼ කටත් වඩා ජනතාවක් වෙසෙන බස්නාහිර පළාත රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ පෙරගමන්කරු ලෙස හඳුන්වා දිය හැකිය. එහි දී ජාතික සංවර්ධන ඉලක්ක අතර ප්‍රමුඛ වන ඒකපුද්ගල ආදායම වසර 2016 වන විට ඇ.ඩො. 4470 දක්වාත්, 2020 වන විට ඇ.ඩො. 8500 දක්වාත් වර්ධනය කිරීම. සාක්ෂරතා අනුපාතය 2016 දී 98% මට්ටමට ඉහළ නැංවීම සහ 2020 වන විට 100% දක්වා වර්ධනය කිරීම, උපතේදී ආයු අපේක්ෂණය 2020 දී පිරිමි අවුරුදු 86 හා ගැහැණු අවුරුදු 80 ක් දක්වා වර්ධනය කිරීම ආදී ජාතික ඉලක්ක සපුරාලීමට බස්නාහිර පළාත් සභාවේ උපරිම දායකත්වය ලබා දීමට අපේක්ෂා කෙරේ.*

*2014 - 2019 පස් අවුරුදු කාලසීමාව සඳහා අප පළාත් සභාව අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති හා වැඩ සටහන් අංශ කිහිපයක් යටතේ ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.*

***අධ්‍යාපනය, පළාත් පාලන, පළාත් පාලන මාර්ග, ඉඩම්***

*බස්නාහිර පළාතේ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කරමින්, භෞතික හා මානව සම්පත් සැපයීම තුළින් ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනයක් ඇති කිරීමට බලාපොරොත්තු වෙමි. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතන 48 ශක්තිමත් කිරීම සඳහා මූල්‍ය, තාක්ෂණික, නෛතික සහාය ලබා දීම සහ මානව සම්පත් සංවර්ධනය තුළින් වඩාත් ප්‍රියමනාප ස්ථාන බවට පත් කිරීම හා සියලු පළාත් පාලන ආයතන සතු ග්‍රාමීය දුෂ්කර මාර්ග සංවර්ධනයට අවශ්‍ය සහාය ලබා දීම හා එකී ආයතනවල සම්බන්ධීකරණයෙන් හා ප්‍රජාව දැනුවත් කරමින් විධිමත් කසළ බැහැර කරලීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නැංවීමේ වැදගත්කම පෙන්වා දෙමි. තවද පළාත් ඉඩම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම, ඊ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ඉඩම් බැහැර කිරීමට අදාළ තොරතුරු පද්ධතියක් ස්ථාපනය කිරීම, පළාත තුළ රජය සතු හිස් ඉඩම් ඵලදායී කාර්යයන් සඳහා යෙදවීමට අපේක්ෂා කෙරේ.*

***කෘෂිකර්ම හා ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු***

*බස්නාහිර පළාතේ කෘෂිකාර්මික කටයුතු නගා සිටුවීම උදෙසා ගුණාත්මක බීජ, රෝපණ ද්‍රව්‍ය සහ යෙදවුම් සුලභ කිරීම, නාගරික හා ග්‍රාමීය ගෙවතු වගාවන් හා වාණිජ මට්ටමින් පළතුරු වගාව දිරි ගැන්වීම, සුළු වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය හා නඩත්තුව හා පුරන් කුඹුරු නැවත වගාව තුළින් පළාතේ වී වගාව නගා සිටුවීමට අපේක්ෂා කෙරේ. එසේ පළාත් වාරිමාර්ග ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම කෙරෙහි ද අවධානය යොමු කරමි.*

*"දේශීය සම්පත් දේශීය දැනුමින් විදේශයන් ජය ගන්නා දේශීය ව්‍යවසායකයෙක් බිහි කිරීම" යන මහිනද චින්තන ජාතික ප්‍රතිපත්තියට අනුව බස්නාහිර පළාත් අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත, කොහු, මැටි කර්මාන්ත, දැව පුහුණු, විද්‍යුත් තාක්ෂණ හා පරිගණක පුහුණු මධ්‍යස්ථාන සඳහා ක්‍රාෆ්ට් ලංකා අලෙවි සැල් යනාදී ක්ෂේත්‍ර තවදුරටත් පුළුල් කිරීමට අපේක්ෂා කෙරේ.*

*"සැප පහසු තෘප්තිමත් ජීවන රටාවක්" යන මහින්ද චින්තන ප්‍රතිපත්තියට අනුව පරිසර සංරක්ෂණයට අදාළ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමට අවධානයට යොමු කරමි.*

එසේම පළාතේ සියලු ජාතීන් හා ආගම් අතර අන්‍යෝන්‍ය සහයෝගීත්වය වර්ධනය වන සංස්කෘතික හා කලා උරුමයන් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

**සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා**

සුව සම්පන්න හෙට දිනක් උදෙසා සැමට නිදහස් සෞඛ්‍ය සේවාවක් සහතික කිරීමේ අරමුණින් මහින්ද චින්තන ඉදිරි දැක්ම මත පිහිටා බටහිර හා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයන්ට අදාළ ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් පළාත් ජනතාවට ලබා දීමේ අරමුණින්, පළාත් රෝහල්වලට අවශ්‍ය භෞතික, මානව සම්පත් ලබා දෙමින් පවුල් සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම සහ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම එක් ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව බැගින් ස්ථාපිත කිරීමට ඉලක්ක කර ඇත.

පරිවාස හා ළමාරක්ෂක සේවා කෙරෙහි අවධානය යොමු කරමින් ළමා සංවර්ධන මධ්‍යස්ථානවල තිරසාරත්ව තහවුරු කිරීම හා ආයතනගත දරුවන් සමාජගත කිරීම යන ප්‍රධාන තේමාවන් යටතේ ඉදිරි සැලසුම් සකස් කෙරෙනු ඇත.

**විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන, නාගරික හා වතු යටිතල පහසුකම්**

විදුලිය සැපයුම 2016 වන විට 100% ක මට්ටමකට ගෙන ඒමේ ජාතික විදුලිබල ප්‍රතිපත්තියට අනුගතව බස්නාහිර පළාතේ සෑම නිවසකටම විදුලිය ලබා දීම, පළාත් මාර්ග සංවර්ධනය 92% දක්වා වර්ධනය කිරීමට ද අපේක්ෂා කෙරේ.

එසේම ජාතික ජල සම්පාදන ප්‍රතිපත්තියට අනුගත වෙමින් නාගරික හා ග්‍රාමීය ජනතාවට පිරිසිදු පානීය ජලය ලබා දීම, පළාතේ ජල සම්පත සංරක්ෂණය කිරීම, ප්‍රජා ජල ව්‍යාපෘති වැඩ සටහන් තවදුරටත් ව්‍යාප්ත කිරීමට කටයුතු කරනු ඇත.

"රැකවරණයෙන් පිරි සමාජයක්" යන්න තේමා කර ගනිමින්, දිළිඳු හා අසරණ ජන කොටස් සඳහා සහන සැලසීම, අනාථ හා අන්ත දුගී පවුල් පුනරුත්ථාපනය හා රෝගාබාධවලින් පෙළෙන්නන්ට ආධාර සැපයීම වැනි සමාජ සුභ සාධන කටයුතු තවදුරටත් පවත්වාගෙන යාමට අපේක්ෂා කරමි.

වතු නිවාස සඳහා යටිතල පහසුකම් සැලසීම, නිවාස අධාර ලබා දීම, කුලී නිවැසියන්ගේ ගැටළු විසඳීම සහ පළාත් රාජ්‍ය සේවකයන් සඳහා නිවාස ව්‍යාපෘති සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

**ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ධීවර හා සංචාරක කටයුතු**

කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා දීමේ අරමුණින් මගී ප්‍රවාහන සේවාවේ ගුණාත්මක තත්ත්වය වර්ධනය කිරීම, මගීන්ට හා මගී ප්‍රවාහන සේවකයින්ට අවශ්‍ය පහසුකම් සැපයීම, ධාවන සැලසුම් ක්‍රියාත්මක කිරීම, නවීන පහසුකම්වලින් යුක්ත පර්යන්ත නැවතුම් පලවල් ඉදි කිරීම, අන්තර් ජාල පහසුකම් මගින් ගෙවීම් කර වාහන අදායම් බලපත්‍ර ලබා ගැනීමේ පහසුකම් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරමි.

ජාතික ප්‍රතිපත්තිවලට අනුගතව බස්නාහිර පළාතේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය, ප්‍රජාවගේ ශාරීරික හා මානසික යෝග්‍යතාවය පවත්වා ගැනීම හා වැඩි දියුණු කිරීම, පළාත් ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා කුසලතාවන් වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය භෞතික හා මූල්‍ය පහසුකම් සැපයීමට අවධානය යොමු කරමි.

පළාතේ බහුතරයක් වන කාන්තාවන් ආර්ථික හා සමාජයීය වශයෙන් තවදුරටත් සවිබල ගැන්වීම උදෙසා ඔවුන්ට අවශ්‍ය දැනුම, තාක්ෂණය හා මූල්‍යමය ශක්තිය ලබා දීමට අපේක්ෂා කරමි.

එසේම මිරිදිය හා කිවුල්දිය ගොවිපල සංවර්ධනය, ධීවර කර්මාන්තයට අවශ්‍ය තාක්ෂණික දැනුම හා පුහුණුව සහ ආම්පන්න ලබා දීම, ධීවර දරුවන්ගේ අධ්‍යාපනය නඟා සිටුවීමට අදාළ ඉදිරි සැලසුම් සකස් කෙරෙනු ඇත.

පළාතේ සංචාරක ආකර්ෂණීය ස්ථාන ආශ්‍රිතව යටිතල පහසුකම් සංවර්ධනය, වෘත්තීය නිපුණත්වය ඉහළ නැංවීම, සංචාරක සේවාවන් සපයන ආයතනවල ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම තුළින් රැකියා අවස්ථා සුලභ කිරීම හා ආදායම් වර්ධනයක් අපේක්ෂා කරමි.

***සමූපකාර, ග්‍රාම සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන කටයුතු***

*පාරිභෝගික ජනතාවට වඩා හොඳ සේවාවක් ලබා දීම උදෙසා කෝප් සිටි, මිනි කෝප් සිටි, ඔසු සැල්, අලෙවි ප්‍රවර්ධන ස්ථාන තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කරන අතර සමූපකාර සේවකයින්ගේ සේවා සුරක්ෂිතභාවය සඳහා විශ්‍රාම වැටුප ඇතුළු පහසුකම් තවදුරටත් ලබා දීමට බලාපොරොත්තු වෙමි.*

*තවද, ග්‍රාම සංවර්ධන සමිති ප්‍රතිසංවිධානය හා ශක්තිමත් කිරීම, ග්‍රාමීය කාන්තා සංවර්ධන මධ්‍යස්ථාන වල පුහුණු කටයුතු තවදුරටත් පුළුල් කිරීමට අපෙක්ෂා කෙරේ.*

*බස්නාහිර පළාත තුළ කිරි නිෂ්පාදන, කුකුල් මස්, බිත්තර හා අනෙකුත් සත්ත්ව නිෂ්පාදන හා අලෙවිය සඳහා හොඳ විභවතාවයක් පවතින බැවින් පශු වෛද්‍යවරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන්ගේ සහාය ලබා ගනිමින් සත්ව පාලන පුහුණු මධ්‍යස්ථානවල කටයුතු තවදුරටත් පුළුල් කිරීමට අපේකෂා කරමි. ඒ තුළින් රැකියා අවස්ථා සුලභ කිරීමත්, ජනතාවගේ පෝෂණ තත්ත්වය නංවාලීමත් අපේක්ෂා කරමි.*

***ගරු සභාපතිතුමනි,***

*ඉහත වැඩසටහන් ක්‍රියාවට නැංවීම උදෙසා අවශ්‍ය මානව සම්පත් ලබා දෙමින් රාජ්‍ය සේවය කෙරෙහි අතිගරු ජනාධිපතිතුමා ප්‍රමුඛ රජය තබා ඇති විශ්වාසය පළාත් සභා රාජ්‍ය සේවය තුළිනුත් තහවුරු කරමින් අවශ්‍ය මානව සම්පත් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හරහා ලබා දීමට ඉදිරි කාලය තුළ දී ද කටයුතු කෙරේ. එසේම පළාත් සභා රාජ්‍ය සේවාවේ නියුතු සමස්ත කාර්යය මණ්ඩලය උදෙසා ක්‍රියාත්මක කර ඇති විශේෂ රක්ෂණාවරණ වැඩ සටහන තවදුරටත් ශක්තිමත් කරමින් ඉදිරියට පවත්වා ගෙන යාමට අදහස් කරමි.*

*ඉහතින් සඳහන් කළ ප්‍රතිපත්ති ආරක්ෂා කරමින් ඉලක්ක හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තිවලට හා මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුකූලව හය වන පළාත් සභා කාලය තුළ සංවර්ධන ප්‍රතිලාභ සැමට බෙදී යන අන්දමින් පළාත තුළ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමටත් ඒ සමඟම පළාතේ ජනතාවගේ සමාජ, සංස්කෘතික, ආගමික හා අධ්‍යාත්මික සංවර්ධනය උදෙසා දහම් පාසැල් හා ආගමික ස්ථාන මුල්කොට වැඩ පිළිවෙළවල් හඳුන්වා දීමටත් බලාපොරොත්තු වේ.*

*මවිසින් ඉදිරිපත් කරන්නට යෙදුණු ප්‍රතිපත්ති ප්‍රකාශයට අදාළ වැඩ පිළිවෙළ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු පළාත් අමාත්‍ය මණ්ඩලයේ මඟ පෙන්වීම මත අමාත්‍යාංශ හරහා ක්‍රියාවට නැංවීමේ දී යහපත් මූල්‍ය විනයක් සහිතව කර ගෙන යාමේ වැදගත්කමක්, අනවශ්‍ය වියදම් අඩු කොට ජනතාවට උපරිම අයුරින් ප්‍රතිලාභ ළඟා කර දීමේ වැදගත්කමක් පෙන්වා දෙන අතර, එහිදී එළදායී විවේචනය හා යෝජනා අමාත්‍යාංශ උපදේශක කාරක සභා තුළ දී සාකච්ඡාවට ගැනීම ඔබ සැමගේ වගකීම බව මා දැඩිව අවධාරණය කරමි.*

*මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීමේදී බස්නාහිර පළාත් සභාව විසින් සකස් කර ඇති උපාය මාර්ග සංවර්ධන සැලැස්මට විශේෂ අවධානය යොමු කළ අතර, අවශ්‍ය සංඛ්‍යා දත්ත හා තොරතුරු ලබා දුන් ප්‍රධාන ලේකම්, ආණ්ඩුකාර ලේකම්, අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු නිලධාරීන්ටත් මගේ ස්තුතිය පුද කරමි.*

*එසේම මෙතෙක් වේලා මගේ ප්‍රතිපත්ති ප්‍රකාශයට සාවධානව සවන් දුන් ඔබතුමන්ලා සියළු දෙනාටම මාගේ ස්තුතිය පුද කරමි.*

*එස්. අලවි මව්ලානා,*
*බස්නාහිර පළාතේ පළාත් ආණ්ඩුකාරවර.*

***[ දෙමළ පරිවර්තනය]***
*[ TAMIL TRANSLATION ]*

***கௌரவ தவிசாளர் அவர்களே, கௌரவ முதலமைச்சர் அவர்களே, கௌரவ அமைச்சர்களே, கௌரவ எதிர்க்கட்சித் தலைவர் அவர்களே, கௌரவ உறுப்பினர்களே,***

***எல்லோருக்கும் காலை வணக்கம்,*** *Good Morning,* ***அஸ்ஸலாமு அழைக்கும்;***

***மக்கள் ஆணையைப் பெற்று இந்த கௌரவ சபைக்குத் தெரிவு செய்யப்பட்ட உங்கள்***

*அனைவருக்கும் வாழ்த்துத் தெரிவிப்பதுடன், மேல் மாகாணத்தின் ஆறாவது மாகாண சபையின் முதலாவது கொள்கை அறிக்கையினைச் சமர்ப்பிப்பதனை இட்டு நான் மிகவும் மகிழ்ச்சியடைகின்றேன்.*

*உங்கள் அனைவரினதும் ஒரே ஒரு எதிர்பார்ப்பு மேல் மாகாண மக்களின் முன்னேற்றத்திற்கு உழைப்பது என்பதே என்று நான் நம்புகின்றேன். எங்கள் மாகாணத்தின் எதிர்வரும் ஐந்து வருடத்திற்கான கொள்கையினைத் தயாரிக்கும் போது மஹிந்த சிந்தனையின் எதிர்கால நோக்கு தேசிய ரீதியிலான வேலைத்திட்டத்திற்கு இணைந்த வகையில் மத்திய அரசின் தாபனங்களின் ஒத்துழைப்பினைத் தொடர்ந்தும் பெற்றுக் கொண்டு கொழும்பு, கம்பஹா, களுத்துறை ஆகிய மாவட்டங்களின் நாகரீக, கிராமிய மற்றும் தோட்டப் பிரிவு மக்களின் பொருளாதார சமூக மற்றும் கலாச்சாரப் பிரிவுகளில் சிறப்பான மேம்பாடு ஒன்றினை ஏற்படுத்துவதற்கு உரிய சிறந்த திட்டத்தினைத் தயாரித்து நடைமுறைப்படுத்தும் முக்கியத்துவத்தினைச் சுட்டிக் காட்ட விரும்புகின்றேன்.*

*இலங்கை மக்களில் ¼ பங்கை விட அதிகமான மக்கள் வாழும் மேல் மாகாணத்தை "நாட்டின் முழு அபிவிருத்திச் செயற்பாட்டின் முன்னோடி மாகாணம்" என அறிமுகப்படுத்தலாம். இங்கு தேசிய அபிவிருத்தி இலக்கின் முக்கியமான ஒன்றான தனிநபர் வருமானத்தினை 2016 ஆம் ஆண்டளவில் 4470 அமெரிக்க டொலர் வரையும், 2020 ஆம் ஆண்டளவில் 8500 அமெரிக்க டொலர் வரையும் அதிகரிப்பது, எழுத்தறிவு வீதத்தை 2016 ஆம் ஆண்டில் 98% மட்டத்திற்கு உயர்த்துவது, அத்துடன் 2020 ஆண்டு அளவில் 100% வரை அதிகரிப்பது, பிறப்பின்போதுள்ள ஆயுள் எதிர்பார்ப்பினை 2020 ஆம் ஆண்டளவில் ஆண்களுக்கு 86 வருடங்கள் எனவும், பெண்களுக்கு 80 வருடங்கள் வரை எனவும் அதிகரிப்பது போன்ற தேசிய இலக்கினைப் பூர்த்தி செய்வதற்கு மேல் மாகாண மாகாண சபை உச்சமான பங்களிப்பினைப் பெற்றுக் கொடுக்க எதிர்பார்க்கின்றது.*

*2014 – 2019 வரையிலான ஐந்து வருட காலத்திற்காக எங்களது மாகாண சபை பின்பற்ற வேண்டிய கொள்கைகள், மற்றும் நிகழ்ச்சித் திட்டங்களை விரிவாக உங்களுக்கு இத்துடன் சமர்ப்பிப்பதுடன், அதன் சுருக்கத்தினை சில பிரிவுகளின் கீழ் சமர்ப்பிக்க விரும்புகின்றேன்.*

***கல்வி, உள்ளூராட்சி, உள்ளூராட்சி மன்றங்களுக்குரிய வீதி, காணி***

*மேல் மாகாணத்தின் கல்வித் துறைக்கு உரிய உட்கட்டமைப்பு வசதிகளை தொடர்ந்தும் அபிவிருத்தி செய்து, பௌதீக மற்றும் மனித வளத்தினை வழங்குவதன் ஊடாக தரமான கல்வி அபிவிருத்தி ஒன்றினை ஏற்படுத்துவதற்கு எதிர்பார்க்கின்றேன். மேல் மாகாணத்தின் 48 உள்ளூராட்சி தாபனங்களையும் வலுப்படுத்துவதற்காக நிதி, தொழில்நுட்ப, சட்டம் சம்பந்தமான ஒத்துழைப்பினைப் பெற்றுக் கொடுத்தல், மற்றும் மனிதவள அபிவிருத்தியின் ஊடாக மிகவும் மனம் கவர்ந்த இடமாக மாற்றுதல், அத்துடன் எல்லா உள்ளூராட்சி தாபனங்களுக்கும் உரிய கிராமிய கரடுமுரடான வீதிகளின் அபிவிருத்திக்கு உரிய உதவியினை வழங்குதல், மற்றும் அத்தாபனங்களின் இணைப்பு செயற்பாடு, மற்றும் மக்களை அறிவுறுத்தி ஒழுங்கான கழிவு அகற்றல் வேலைத் திட்டத்தினை நடைமுறைப்படுத்தும் முக்கியத்துவத்தினைச் சுட்டிக் காட்ட விரும்புகின்றேன். மேலும் மாகாண காணி நியதிச் சட்டத்தினை நடைமுறைப்படுத்துதல், ஈ அரச கொள்கைக்கு இணங்க காணி அகற்றலுக்குரிய தகவல் அமைப்பு ஒன்றை ஸ்தாபித்தல், மாகாணத்தினுள் அரசுக்கு உரிய பயிரிடாத வெற்றுக் காணிகளை உற்பத்தித் திறன் மிக்க விடயங்களுக்காகப் பயன்படுத்த எதிர்பார்க்கப்படுகின்றது.*

***விவசாய மற்றும் கமநல அபிவிருத்தி, சிறு நீர்ப்பாசன கைத்தொழில், சுற்றாடல் நடவடிக்கை, கலை கலாச்சார நடவடிக்கை***

*மேல் மாகாணத்தின் விவசாய நடவடிக்கைகளை மேம்படுத்துவதற்காக தரமான நாற்று விதைப் பொருட்களை பயன்படுத்துவதை சுலபமாக்குதல், நகர மற்றும் கிராமிய வீட்டுத் தோட்டச் செய்கை, மற்றும் வியாபார மட்டத்தில் பழச் செய்கையினை ஊக்குவித்தல், சிறு நீர்ப்பாசன அமைப்புக்களின் புனர் நிர்மாணம், மற்றும் பராமரிப்பு, மற்றும் பயிரிடப்படாத நிலங்களை மீண்டும் பயிரிடுவதன் ஊடாக மாகாணத்தின் நெற் - செய்கையினை உயர்த்துவதற்கு எதிர்ப்பார்க்கப்படுகின்றது. அவ்வாறே மாகாண நீர்ப்பாசன நியதிச் சட்டத்தினை தயாரிப்பது தொடர்பாக கவனத்தினைச் செலுத்தி உள்ளேன்.*

*“உள்நாட்டு வளங்கல் உள்நாட்டு அறிவினால் வெளிநாட்டார்களை வெற்றி கொள்ளும் உள்நாட்டு முதலீட்டாளர்களை உருவாக்குதல்” என்ற மஹிந்த சிந்தனையின் தேசிய கொள்கைக்கு இணங்க மேல் மாகாணத்தின் கைத்தறி இயந்திர நடவடிக்கை கைத்தொழில், தும்பு, களிமண் கைத்தொழில், மரவேலைப் பயிற்சி, மின், தொழில் நுட்பம் மற்றும் கணினிப் பயிற்சி நிலையங்கள் அத்துடன் கிராப்ட் லங்கா விற்பனைச் சாலை போன்ற துறைகளை மேலும் விரிவுபடுத்த எதிர்ப்பார்க்கப்படுகின்றது.*

*“சௌகரியமான, இலகுவான, திருப்திகரமான வாழ்க்கை முறை” என்ற மஹிந்த சிந்தனையின் கொள்கைக்கு இணங்க, சுற்றாடல் பாதுகாப்புக்கு உரிய கொள்கை மற்றும் திட்டத்தினைத் தயாரிக்க கவனம் செலுத்தி உள்ளேன்.*

*அவ்வாறே மாகாணத்தின் எல்லா இனம் மற்றும் சமயங்களுக்கிடையே அன்னியோன்னியம், மற்றும் ஒத்துழைப்பு மேம்படுவதற்குரிய கலை மற்றும் கலாச்சார உரிமைகளை மேம்படுத்துவது எதிர்பார்க்கப்படுகின்றது.*

***சுகாதார, உள்நாட்டு வைத்திய, நன்நடத்தை மற்றும் சிறுவர் பாதுகாப்புச் சேவை***

*நோயற்ற எதிர்காலம் ஒன்றுக்காக, இலவசமான சுகாதார சேவை ஒன்றினை உறுதிப்படுத்தும் நோக்கில் மஹிந்த சிந்தனையின் எதிர்கால நோக்கின் கீழ் மேலைத்தேய மற்றும் உள்நாட்டு வைத்திய துறைக்கு உரிய தரமான சுகாதார சேவை ஒன்றினை மாகாண மக்களுக்கு பெற்றுக் கொடுக்கும் நோக்கில், மாகாண வைத்தியசாலைகளுக்குத் தேவையான பௌதீக மற்றும் மனித வளங்கலைப் பெற்றுக் கொடுத்து குடும்ப சுகாதார சேவையினை வலுப்படுத்துதல், மற்றும் ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவிலும் ஒரு ஆயுர்வேத மத்திய மருந்தகத்தினை ஸ்தாபிப்பது இலக்காகக் கொள்ளப்பட்டுள்ளது.*

*நன்நடத்தை சிறுவர்பாதுகாப்புச் சேவை தொடர்பாக கவனத்தைச் செலுத்தி சிறுவர் அபிவிருத்தி நிதியங்களின் நிரந்தரத் தன்மையை உறுதிப்படுத்தல், மற்றும் தாபனப்படுத்தப்பட்ட பிள்ளைகளை சமூக மயப்படுத்துதல் போன்ற பிரதான தொனிப் பொருளின் கீழ் எதிர்காலத் திட்டம் தயாரிக்கப்படும்.*

***மின்சக்தி, எரிசக்தி, மாகாணவீதி, வீடமைப்பு மற்றும் நிர்மானம், நீர் வழங்கல் வடிகாலமைப்பு சமூக நலன்புரி நகர மற்றும் தோட்ட உட்கட்டமைப்பு வசதிகள்***

*2016 ஆம் ஆண்டளவில் மின்சாரம் வழங்குவதை 100% என்ற நிலைக்கு கொண்டு சென்று, தேசிய மின்சாரக் கொள்கைக்கு இணங்க மேல் மாகாணத்தின் ஒவ்வொரு வீட்டிற்கும் மின்சாரத்தினை வழங்குவதும், மாகாண வீதி அபிவிருத்தியை 92% வரை அதிகரிப்பதற்கும் எதிர்பார்க்கின்றது.*

*அவ்வாறே தேசிய நீர்வழங்கல் கொள்கைக்கு இணங்க நகர மற்றும் கிராமிய மக்களுக்கு சுத்தமான*

*குடிநீரைப் பெற்றுக் கொடுத்தல், மாகாணத்தின் வளத்தைப் பாதுகாத்தல், சமூகத்தின் செயற்றிட்டங்களை தொடர்ந்தும் விரிவுபடுத்துவதற்கும் நடவடிக்கை எடுக்கப்படும்.*

*“பாதுகாப்பு நிறைந்த சமூகம் ஒன்று” என்பதை தொனிப் பொருளாகக் கொண்டு, கஷ்டப்பட்ட மற்றும் ஏழை மக்களுக்காக சலுகை வழங்குதல். அனாதை மற்றும் ஏழை குடும்பங்களின் புனர்வாழ்வு மற்றும் நோய்களினால் பிடிக்கப்பட்டுள்ளவர்களுக்கு உதவி வழங்குதல் போன்ற சமூக நலன்புரிச் செயற்பாடுகளை தொடர்ந்தும் நடாத்திச் செல்வதற்கு எதிர்பார்க்கப்படுகின்றது. தோட்ட வீடுகளுக்காக உட்கட்டமைப்பு வசதிகளை வழங்குதல், வீடமைப்பு உதவிகளை வழங்குதல், வாடகை வீட்டில் வசிப்பவர்களின் பிரச்சினையைத் தீர்த்தல், அத்துடன் மாகாண சபை ஊழியர்களுக்கு வீடமைப்பு செயற்றிட்டத்தை திட்டமிட்டு நடைமுறைப்படுத்தவும் எதிர்பார்க்கின்றேன்.*

***போக்குவரத்து விளையாட்டு மற்றும் இளைஞர் விவகாரம், மகளிர் விவகாரம் கடற்றொழில் மற்றும் உல்லாசத் துறை நடவடிக்கை***

*வினைத்திறன் மிக்க போக்குவரத்துச் சேவை ஒன்றினை பெற்றுக் கொடுக்கும் நோக்கில் பயணிகள் போக்குவரத்துச் சேவையின் தரத்தினை அதிகரித்தல், பயணிகளுக்கு, பயணிகள் போக்குவரத்து சேவை ஊழியர்களுக்கு தேவையான வசதிகளை வழங்குதல், பயண ஓட்ட திட்டத்தினை நடைமுறைப்படுத்துதல், நவீன வசதிகளைக் கொண்ட எல்லைப்புற தரிப்பிடங்களை நிர்மாணித்தல், இணையத்தள வசதிகளின் மூலம் கொடுப்பனவினைச் செலுத்தி வாகன இறைவரி அனுமதிப்பத்திரம் பெற்றுக் கொள்ளும் வசதிகளை மேம்படுத்துவது எதிர்பார்க்கப்படுகின்றது.*

*தேசிய கொள்கைக்கு இணங்கிய வகையில் மேல் மாகாணத்தின் விளையாட்டுத் துறையின் அபிவிருத்தி, சமூகத்தின் உடல் உள சீர் தன்மையைப் பேணிச் செல்லுதல், மற்றும் மேம்படுத்துதல், மாகாண விளையாட்டு வீரர்களின் விளையாட்டுத் திறமைகளை மேம்படுத்துவதற்கு தேவையான பௌதீக மற்றும் நிதி வசதிகளை வழங்குவதற்கு கவனத்தைச் செலுத்துவேன்.*

*மாகாணத்தின் பெரும்பான்மையினராகக் காணப்படும் பெண்களை பொருளாதார மற்றும் சமூக ரீதியில் தொடர்ந்தும் ஊக்கப்படுத்துவதற்காக அவர்களுக்குத் தேவையான அறிவு, தொழில் நுட்பம் மற்றும் நிதி ரீதியான பலத்தினைப் பெற்றுக் கொடுப்பதற்கு எதிர்ப்பார்க்கப்படுகின்றது.*

*அவ்வாறே நன்னீர், மற்றும் கடல் நீர் மீன் பண்ணைகளின் அபிவிருத்தி கடற் றொழிலுக்குத் தேவையான தொழில் நுட்ப அறிவு மற்றும் பயிற்சி அத்துடன் உபகரணங்களைப் பெற்றுக் கொடுத்தல் மீனவ குடும்பங்களில் உள்ள பிள்ளைகளின் கல்வியை மேம்படுத்துவதற்காக எதிர்காலத் திட்டமொன்று தயாரிக்கப்படும்.*

*மாகாணத்தின் கண்கவர் இடங்களை அண்மித்த பகுதிகளின் உட்கட்டமைப்பு வசதிகளின் அபிவிருத்தி, தொழில் நிபுணத்துவத்தை உயர்த்துதல், சுற்றுலாத்துறை சேவையை வழங்கும் தாபனங்களின் தரத்தினை மேம்படுத்துவதனூடாக தொழில் சந்தர்ப்பத்தினை சுலபமாக்குதல், மற்றும் வருமான அதிகரிப்பு ஒன்றினையும் எதிர்பார்க்கின்றேன்.*

***கூட்டுறவு, கிராம அபிவிருத்தி, வீட்டுப் பொருளாதார மேம்பாட்டு, கால் நடை உற்பத்தி மற்றும் அபிவிருத்தி நடவடிக்கை***

*பாவனையாளர்களான மக்களுக்கு மிகவும் சிறந்த சேவை ஒன்றினைப் பெற்றுக் கொடுப்பதற்காக கோப்சிட்டி, மினி கோப்சிட்டி, ஒசுசல போன்ற விற்பனை மேம்பாட்டு நிலையங்களை தொடர்ந்தும் மேம்படுத்துவதற்கு எதிர்பார்ப்பதுடன் கூட்டுறவு ஊழியர்களின் சேவைப் பாதுகாப்பிற்காக ஓய்வூதிய*

*சம்பளம் உள்ளிட்ட வசதிகளைத் தொடர்ந்தும் பெற்றுக் கொடுப்பதற்கு எதிர்பார்க்கின்றேன்.*

*மேலும், கிராம அபிவிருத்தி சங்கங்களின் மறுசீரமைப்பு, மற்றும் வலுப்படுத்துதல், கிராமிய பெண்கள் அபிவிருத்தி நிலையங்களின் பயிற்சி நடவடிக்கைகளை தொடர்ந்தும் விரிவு படுத்துவதற்கு எதிர்பார்க்கப்படுகின்றது.*

*மேல் மாகாணத்தினுள் பால் உற்பத்தி, கோழி இறைச்சி, முட்டை, மற்றும் ஏனைய விலங்கு உற்பத்தி மற்றும் விற்பனைக்காக சிறந்த வழியொன்று காணப்படுகின்ற படியால் கால்நடை வைத்தியர்கள் உள்ளிட்ட ஏனைய உத்தியோகத்தர்களின் ஒத்துழைப்பினைப் பெற்றுக் கொண்டு விலங்கு வளர்ப்பு பயிற்சி நிலையங்களின் நடவடிக்கைகளைத் தொடர்ந்தும் விரிவு படுத்துவதற்கு எதிர்ப்பார்க்கின்றேன். இதனூடாக தொழிற் சந்தர்ப்பத்தினை இலகுபடுத்துவதும், மக்களின் போசாக்கு மட்டத்தினை உயர்த்துவதும் எதிர்ப்பார்க்கப்படுகின்றது.*

*கௌரவ தவிசாளர் அவர்களே,*

*மேலே உள்ள நிகழ்ச்சித் திட்டங்களை நடைமுறைப்படுத்துவதற்கு தேவையான மனித வளத்தைப் பெற்றுக் கொடுத்து அரச சேவை தொடர்பாக மேன்மை தங்கிய ஜனாதிபதி உள்ளிட்ட அரசு வைத்துள்ள நம்பிக்கையை மாகாண சபை அரச சேவையினுள்ளும் உறுதிப்படுத்தி தேவையான மனித வளத்தை மாகாண அரச சேவை ஆணைக்குழுச் சபையின் மூலம் பெற்றுக் கொடுப்பதற்கு எதிர்காலத்தில் நடவடிக்கை எடுக்கப்படும். அவ்வாறே மாகாண சபை அரச சேவையில் உள்ள எல்லாப் பணியாட் தொகுதியினருக்குமாக நடைமுறைப்படுத்தப்பட்டுள்ள விஷேட காப்புறுதி நிகழ்ச்சித் திட்டத்தினை வலுப்படுத்தி தொடர்ந்தும் முன்கொண்டு செல்வதற்கு எண்ணியுள்ளேன்.*

*மேலே குறிப்பிடப்பட்ட கொள்கைகளைப் பாதுகாத்து, இலக்கு மற்றும் நோக்கத்தினை நிறைவேற்றிக் கொள்வதற்காக தேசிய கொள்கை, மற்றும் மஹிந்த சிந்தனையின் எதிர்கால நோக்கிற்கு இணங்கிய வகையில் ஆறாவது மாகாண சபைக் காலத்தினுள் அபிவிருத்தியின் பலாபலன் ஒவ்வொருவருக்கும் கிடைப்பதற்கு ஏற்ற முறையில் மாகாணத்தினுள் பொருளாதார அபிவிருத்தி ஒன்றினை ஏற்படுத்துவதற்கும் அத்துடன் மாகாண மக்களின் சமூக, கலாச்சார, சமய மற்றும் ஆன்மீக அபிவிருத்திக்காக அறநெறிப் பாடசாலைகள், மற்றும் சமய நிலையங்களை அடிப்படையாகக் கொண்ட வேலைத் திட்டங்களை அறிமுகப்படுத்துவதற்கு எதிர்பார்க்கின்றேன்.*

*என்னால் முன்வைக்கப்பட்ட கொள்கை அறிக்கைக்குரிய வேலைத் திட்டங்களை கௌரவ முதலமைச்சர் உள்ளிட்ட அமைச்சரவையின் வழிகாட்டலின் கீழ் அமைச்சுக்களினூடாக நடைமுறைப்படுத்தும் போது சிறந்த நிதி ஒழுக்கப் பயன்பாடு நிறைந்ததாக மேற்கொண்டு செல்வதன் முக்கியத்துவம், மற்றும் தேவையற்ற செலவுகளை குறைத்து மக்களுக்கு உச்ச அளவில் பலாபலன் கிடைக்கக் கூடிய முறையின் முக்கியத்துவத்தைச் சுட்டிக் காட்டுவதுடன், இங்கு பயனுள்ள விமர்சனங்கள், மற்றும் பிரேரணைகளை அமைச்சின் ஆலோசனைச் செயற்குழுக்களில் கலந்துரையாடலுக்கு எடுப்பது உங்கள் அனைவரினதும் பொறுப்பு என்பதை நான் மிகவும் கவனத்துடன் வலியுறுத்துகின்றேன். இந்த கொள்கை அறிக்கையினைத் தயாரித்த வேளையில் மாகாண சபையினால் தயாரிக்கப்பட்டுள்ள உபாய ரீதியிலான அபிவிருத்தித் திட்டத்திற்கு விசேடமாக கவனத்தைச் செலுத்தியதுடன் தேவையான புள்ளி விபரங்கள், மற்றும் தகவல்களை பெற்றுக் கொடுத்த பிரதம செயலாளர், ஆளுநரின் செயலாளர், அமைச்சின் செயலாளர்கள் உள்ளிட்ட உத்தியோகத்தர்களுக்கு*

*எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அவ்வாறே இவ்வளவு நேரமும் இக் கொள்கை அறிக்கைக்கு செவிமடுத்த உங்கள் அனைவருக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.*

*எஸ். அலவி மௌலானா*
*மேல் மாகாணத்தின் மாகாண ஆளுநர்.*

***පූ.භා. 11.26 ට ප්‍රතිපත්ති ප්‍රකාශනය කියවීම අවසන් විය. අනතුරුව, ගරු ආණ්ඩුකාරතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන් පූ.භා. 11.29 ට ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.***
*Reading of the Policy Statement concluded at 11.26 a.m. Consequently, as the Hon. Governor withdrew from Chair, Hon. Chairman presided at 11.29 a.m.*

# සභාපතිවරයාගේ නිවේදනය
ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"අද දින සභා රැස්වීමෙන් අනතුරුව මීළඟ සභා රැස්වීම 2014 මැයි මස 20 වන දින බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී පැවැත්වීමට සුදුසු බවට මා වෙත යෝජනා කිහිපයක් ඉදිරිපත් වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් නියමිත ඒකඟතාවයන් මෙම සභාව කල් තබන අවස්ථාවේදී මා වෙත ලබා දෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා."*

# නොපැමිණ සිටීමේ අවසරය
LEAVE OF ABSENCE

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, "*රොයිස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමාට මාසයක කාලයක් නිවාඩු ලබා දිය යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත ස්තූතිය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව. මම ඒ සඳහා බස්නාහිර පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්, අමාත්‍යවරයෙක් වශයෙන් කටයුතු කරන ලද හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමාට ගරු ආණ්ඩුකාරතුමාට ස්තූතිය පළ කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීමට ආරාධනා කරනවා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

*නැඟී සිටියේය.*
*[Stood up]*

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමා විසින් ආණ්ඩුකාරතුමා ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීම පිළිබඳව ස්තූතිය ප්‍රකාශ කරන්න යෝජනා කරන්න ආරාධනා කළා. නමුත් මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ දෙමළ භාෂාවෙන් ලියැවිලා නැහැ. මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරනකොට දෙමළ භාෂා පරිවර්තනය ඉදිරිපත් කර නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. දෙමළ භාෂාවෙන් ලියැවිලා තිබෙනවා. මේ වන විට පොත්පත් ලැබෙන්න ඇති.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ලියැවිලා නැහැ. මේ අපට ලබා දීලා තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, දෙමළ භාෂාවෙන් අවශ්‍ය මන්ත්‍රීතුමන්ලාට ලබා දීලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දෙමළ මන්ත්‍රීවරයෙක් නොවෙයි නේ? ඔබතුමා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මම දෙමළ මන්ත්‍රීවරයෙක් වෙන්න ඕනෑ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙමළ කථා කරන මන්ත්‍රීතුමන්ලාට ලබා දීලා තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

එක සමාන වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමා, ඔබතුමා ඔය කරන ප්‍රකාශය වැරැදියි. ඒක නිවැරැදි කරගන්න. එහෙමනම් අපට-

**ගරු මොහමඩ් ඉෆ්තිකාර්**
Hon. Mohamed Ifthikaar

ලබා දීලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මම කාරුණිකව ඉල්ලා සිටිනවා. ඔබතුමා බස්නාහිර පළාත් සභාවේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්. හිටපු විපක්ෂ නායකතුමා. අද මේ ආරම්භක රැස්වීම. ඔබතුමාට අපි ස්තුතිවන්ත වෙනවා, එය යොමු කිරීම සම්බන්ධයෙන්. ඔබතුමා -

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඔබතුමාට මම පෙන්වන්න කැමැතියි 36(1) පිළිබඳව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට අවස්ථාව ලබා දෙනවා. ඔබතුමාට ගරු කරනවා. ඔබතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ප්‍රතිපත්ති ප්‍රකාශය පිළිබඳව මම සෑහීමකට පත් වෙන්නේ නැහැ. මුස්ලිම් මන්ත්‍රීවරුන්ටත් නැහැ. ද්‍රවිඩ භාෂාවෙන්. සමාන සැලකීමක් අවශ්‍ය වෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

ලබා දීලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපේ හිටපු ගරු විපක්ෂ නායකතුමා, අපෙන් ඉල්ලීම් කරන ලද ගරු මන්ත්‍රීතුමන්ලාට අපි ලබා දීලා තිබෙනවා. ඒ ඒ භාෂාවලින් මුද්‍රණය කරන ලද පොත්පත්. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාටත් අවශ්‍ය නම් අපි ලබා දෙන්නම්. නොලැබුණු ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකර මට දැනුම් දෙන්න.

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් නිශ්ශබ්ද වන්න. මූලාසනයට ගරු කරන්න කෝ? අද අපේ මේ ආරම්භක රැස්වීම. ගරු මන්ත්‍රීතුමා අපේ යම් යම් අඩුපාඩු තිබෙන්න පුළුවන්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ඒක තමයි මම පෙන්නලා දුන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. නමුත් ඔබතුමාට ප්‍රතිපත්ති ප්‍රකාශයේ දෙමළ පිටපතක් අවශ්‍ය නම් ඔබතුමාට පොතක් ලබා දෙන්නම්.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මට විතරක් නොවෙයි. හැම මන්ත්‍රීවරයෙක්ටම අවශ්‍යයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. හැම මන්ත්‍රීවරයෙක්ටම නොවෙයි. අපෙන් ඉල්ලීම් කරන මන්ත්‍රීතුමන්ලාට -

[සභාවේ ඝෝෂා]

ගරු මන්ත්‍රීතුමා, දෙමළ ප්‍රකාශනය තිබෙනවා. පැහැදිලිව තිබෙනවා. අවශ්‍ය අයට අපි ලබා දීලා තිබෙනවා. අපෙන් ඉල්ලීම් කරන ලද මන්ත්‍රීතුමන්ලාට අපි ලබා දීලා තිබෙනවා. ඔබතුමාටත් අවශ්‍ය නම් ලබා දෙන්නම්.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමා, ආණ්ඩු පක්ෂය වෙනුවෙන් ඉල්ලීමක් කරනවා, එතුමාටත් දෙමළ පිටපතක් ලබා දෙන්න කියලා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මෙතුමාට නියෝගයක් දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අපි අද ආරම්භ කරපු අපේ පළමු රැස්වීම මේ. ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය. මම දන්නවා. ඔබතුමා රීති ගැන හසල දැනුමක් තිබෙන මන්ත්‍රීවරයෙක්. ඔබතුමාට ඒ තරම් දැනුමක් තිබෙනවා. අපි ඒක පිළිගන්නවා. ගරු මන්ත්‍රීතුමා, අපි ඔබතුමාට ගරු කරනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

නිවැරැදි කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒක නිවැරැදි කරනවා. ඔබතුමා කරුණාකර වාඩි වෙන්න. මම ස්තුතිවන්ත වෙනවා. දිගින් දිගටම ප්‍රකාශ කරන්න ඉඩ දෙන්න බැහැ. කරුණාකර වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, සභාවේ එක් මන්ත්‍රීවරයෙකුට පළමු සභාවට සහභාගි වීමට අයිතිය නැති වෙලා තිබෙනවා. ඒක ඔබතුමාගේ යුතුකමක් හැටියට මම සලකනවා. එතුමා චෝදනාවක් පමණක් ලැබූ මන්ත්‍රීවරයෙක් හැටියට මේ සභාවට පැමිණීමේ අයිතිය ආරක්ෂා කරලා දෙන්න ඕනෑ ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන්ම ලබා දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මන්ත්‍රීවරු වෙනුවෙන් පෙනී සිටින්නේ ඔබතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා පිළිබඳව අධිකරණයේ යම් යම් තීන්දු ගැනීමේ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා චෝදනාවක් පමණක් ලැබූ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තවම තීන්දු කරලා නැහැ නේ ගරු මන්ත්‍රීතුමා. අපට ඒ පිළිබඳව සභාවේ තීරණය කරන්න බැහැ. අධිකරණය තුළ විවාද වන, අධිකරණය තුළ සාකච්ඡා වන කාරණයක් ඒක.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මිනී මැරුම් චෝදනා තිබෙන කට්ටියත් පාර්ලිමේන්තුවේ වාඩි වෙනවා. එතුමාට තිබෙන්නේ චෝදනාවක් පමණයි. එතුමාට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඊළඟ රැස්වීමට එතුමාට සහභාගි වෙන්න පුළුවන් ඉඩකඩ අපි ලබා දෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අද මෙතැන ඉන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද නොසිටිය එක වෙන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා ඡායාරූපයටත් අද නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා මා වෙත ඉල්ලීමක් කරන්න. මට තවම ඉල්ලීමක් ලැබිලා නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක ඔබතුමාගේ වගකීමක්. පළාත් සභාවක් හැටියට -

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමා, අපි කැමැතියි ඒ මන්ත්‍රීතුමාගේ නම කියන්න. චෝදනාව තිබෙන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාගෙන් ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අද අපේ මේ ආරම්භක රැස්වීම. ඒ නිසා අපි මෙය බොහොම සුහදව, ගෞරවාන්විතව අවසන් කරමු. විවාදවලට අපට ඉඩකඩ තිබෙනවා. ඔබතුමන්ලාට අවස්ථාව දෙන්නම්.

[සභාවේ ඝෝෂා]

මම ගරු මන්ත්‍රීතුමන්ලාගේ වරප්‍රසාද ආරක්ෂා කරනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. කරුණාකර මට මේ සභාවේ න්‍යාය පත්‍රයට යන්න දෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මොකක්ද ඔබතුමාගේ 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නය?

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

එතුමාට අහන්න අයිතියක් තිබෙනවා නම් මේ සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් මටත් අයිතියක් තිබෙනවා, අත්අඩංගුවට අරගෙන තිබෙන්නේ මොන චෝදනාව යටතේද කියලා විමසන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත්ම ගෞරවයෙන් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම මම කාරුණිකව ඉල්ලා සිටින්නේ. මොකද මේ හැම මන්ත්‍රීවරයෙක්ම අපේ සභා රීති පිළිබඳව දැනුවත් වෙලා ඉන්නේ. මහජන ඡන්දයෙන් තේරීපත් වුණු මන්ත්‍රීතුමන්ලා ඉන්නේ. විශේෂයෙන්ම අපේ කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා, හිටපු විපක්ෂ නායකතුමා පළපුරුද්දක් තිබෙන, රීති සම්බන්ධව වරින් වර, විවිධ අවස්ථාවල අපට අවශ්‍ය සහාය ලබා දීපු මන්ත්‍රීවරයෙක්. එදත් ඔබතුමා ඡන්දය අවස්ථාවේදී රීති පිළිබඳව අපව දැනුවත් කළා. සීනුව නාද කෙරුවේ නැහැයි කියලා. මම ඔබතුමාව අගය කරනවා. අදත් ඔබතුමා යම්කිසි රීතියක් සම්බන්ධව අපව දැනුවත් කළා. මාව දැනුවත් කළා. ස්තූතිවන්ත වෙනවා. ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයත් සමග පුංචි න්‍යාය පත්‍රයක් තිබෙන්නේ. ඒ නිසා මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අපට තව සභා රැස්වීම් තිබෙනවා. ඉදිරියේදී සභා රැස්වීම් තිබෙනවා. ඔබතුමන්ලාගේ වරප්‍රසාද පිළිබඳව අපට කථා බහ කරන්න පුළුවන්. ඒ නිසා ඔබතුමා නැඟූ ප්‍රශ්නය පිළිබඳව, මම ගරු විපක්ෂ නායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා ඒ පිළිබඳව මගෙන් ඉල්ලීමක් කරන්න. මම ඊළඟ සභා රැස්වීම වෙන කොට එතුමාව සභාවට කැඳවීමට

[ගරු සභාපතිතුමා]

අවශ්‍ය කටයුතු සිදු කරලා දෙනවා. ඔබතුමා මගෙන් ඉල්ලීමක් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මමත් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරනවා. මම ඉල්ලන්න දෙයක් නැහැ. මේ සභාවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කිරීමේ වගකීම තිබෙන්නේ සභාපතිවරයා හැටියට ඔබතුමාගේ යටතේ. අපි ගියවරත් ප්‍රකාශ කළා. ඔහුට සභා වාරයට සහභාගිවීමට අවශ්‍ය අවකාශය ලබා දුන්නේ නැහැ. දිවුරුම් දීමට පමණයි පොලිසිය ඔහුව තියා ගත්තේ. මම ගියවර ඒ පිළිබඳව අපේ සභා ලේකම්තුමාව දැනුවත් කළා, අනිවාර්යයෙන්ම පළාත් සභා රැස්වීමට ඔහුව රඳවාගන්න අවශ්‍ය කටයුතු කරන්නය කියලා. මම පුද්ගලිකව ගිහිල්ලා ඔහුව රැගෙන ඇවිල්ලා තිබුණු සහකාර පොලිස් අධිකාරීතුමා හම්බ වෙලා කිව්වා. නමුත් එතුමා මට මතක් කළේ, ඒ සම්බන්ධව සභාව මට්ටමින් දැන්වීමක් කරලා ඒක ඉල්ලන්න තිබුණා කියලා. උසාවිය අපට නියෝගයක් කරලා තිබෙන්නේ දිවුරුම් දීමට පමණක් කියන කාරණය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා වැරදි අර්ථකථනයක් දෙන්න එපා. සභාව නොමඟ යවන්න එපා. අපි මේ න්‍යාය පත්‍රය සෑම මන්ත්‍රීවරයෙකුගේම නිවසට අපි ලබා දීලා තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ සභා ලේකම් කාර්යාලය හරහා ඉල්ලීමක් කරන්නය කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා ලේකම් කාර්යාලය - ගරු මන්ත්‍රීතුමා අපි උදව් කරන්නම්.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාපතිතුමාගේ වගකීමක්.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නැහැ. නැහැ. ඒක අපේ අවශ්‍යතාවයක්. අපි ඉල්ලන්න ඕනෑ. මමත් රිමාන්ඩ් වුණු කෙනෙක්. දවස් දාහතරෙන් දාහතරට -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අයිතිකාරයන්ගෙන් වාහන ඉල්ලගෙන ගිහිල්ලා කොල්ල කාලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, අනවශ්‍ය විවාදවලට යන්න එපා. මම ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා. අපේ අලුත් මන්ත්‍රීතුමන්ලා රාශියක් ඉන්නවා. ඒ නිසා කරුණාකර සභාව ආදර්ශමත් වෙන්න. ජ්‍යෝෂ්ට මන්ත්‍රීවරු ආදර්ශමත් මෙන්න. තරුණ අලුත් මන්ත්‍රීවරු රාශියක් ඉන්නවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. පළාත් සභා මන්ත්‍රීවරයෙක් හැටියට මංකොල්ලයකට සම්බන්ධ වුණු කෙනෙක් ගැන මේ සභාවේ ගරු සභාපතිතුමාට මැදිහත්වෙන්න තිබෙන අයිතිය මොකක්ද කියලා. යහපාලනය ගැන කථා කරන විපක්ෂය මංකොල්ලයක් කාපු කෙනෙක් ගැන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් වෙලා නැහැ. ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා, සභාව මේ විදියට යන්න ගියොත් මට කරගෙන යන්න බැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොන වරප්‍රසාදය ගැනද කථා කරන්නේ.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමා මැදිහත් වෙන්න ඕනෑ හොරෙකුටද?

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කරුණාකර යෝජනාව ඉදිරිපත් කරන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

## ගරු ආණ්ඩුකාරතුමාට ස්තූතිය පළ කිරීමේ යෝජනාව
VOTE OF THANKS TO THE HON. GOVERNOR

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාට ප්‍රථමයෙන් ස්තූතිවන්ත වෙනවා. ගරු ආණ්ඩුකාරතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිඳව යෝජනාව ඉදිරිපත් කිරීමට මට පසුතලය නිර්මාණය කරදීම පිළිබඳව.

*" ගරු සභාපතිතුමනි, ජනවරමින් නැවතත් තහවුරු කළ අපරිමිත ජනතා විශ්වාසයට ගරු කරමින් හා සියලුම දේශපාලන පක්ෂවල සාධාරණ හා ඵලදායී දේශපාලන අදහස්වලට ගරු කරමින්ද, බස්නාහිර පළාතේ මානව හා භෞතික සම්පත් ඒකරාශී කර දැනට රට පුරා ක්‍රියාත්මක දැවැන්ත ජාතික සංවර්ධන වැඩ පිළිවෙළට සමගාමීව මධ්‍යම රජයේ සහාය තවදුරටත් ලබා ගනිමින් ක්‍රියාත්මක කරන සංවර්ධන ක්‍රියාදාමයන් තුළින් සංවර්ධන ප්‍රතිලාභ සැමට බෙදී යන අන්දමින් බස්නාහිර පළාත් ජනතාවගේ ඒකායන බලාපොරොත්තුව වූ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන්හි නාගරික හා ග්‍රාමීය හා වතු අංශයන්හි පොදු මහජනතාවගේ දියුණුව සැලසීම උදෙසා, පළාත තුළ ආර්ථික සංවර්ධනයක් ඇති කර පළාත් ජනතාවගේ ආර්ථික, සමාජ, සංස්කෘතික, ආගමික හා අධ්‍යාත්මික සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ පෙරදැරිව බස්නාහිර පළාතේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍ය මණ්ඩලය බස්නාහිර පළාතේ පළාත් සභාවේ VI වන පළාත් සභාව සඳහා සකස් කළ ප්‍රතිපත්ති ප්‍රකාශය 2014 අප්‍රේල් මස 30 වන දින එනම්, අද දින මෙම පළාත් සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ ගරු ආණ්ඩුකාර තැන්පත් අල්හාජ් අලවි මව්ලානා මැතිතුමා වෙත මෙම සභාව මහත් ගෞරවයෙන් යුතුව සිය ස්තූතිය පළ කර සිටින්නීය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි**
Hon.Gamini Thilakasiri

ගරු සභාපතිතුමනි, ස්තූතිය ප්‍රකාශ කිරීමේ යෝජනාව මම ස්ථිර කරනවා. එම විවාදය ඊළඟ සභා රැස්වීම් දිනයේදී සිදු කිරීම සුදුසු යැයි මම ඉල්ලා සිටිනවා.

***ඊට සභාවේ එකඟත්වය පළ වුයෙන්, ගරු සභාපතිතුමා විසින් යෝජනාව ඊළඟ සභාවට යොමු කරන ලදී.***
*Since the consent of the Council was granted to it, the proposition was referred to the next Council by the Hon. Chairman.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දින සභාව ආරම්භයේදී මම ඔබතුමන්ලාට දැනුම් දුන් පරිදි මෙම සභාව අද දින විසිර යැමෙන් පසුව පවත්වන දිනය පිළිබඳව තීරණයක් ගත යුතුව තිබෙනවා. ඒ අනුව දිනයක් යෝජනා කරන මෙන් මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

## පළාත් සභාවේ රැස්වීම
PROVINCIAL COUNCIL MEETING

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, "*අද දින විසිර යැමෙන් අනතුරුව මෙම සභාව 2014 මැයි මස 20 වන දින පෙ.ව. 09.30 ට රැස් විය යුතු යැයි*" යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාවේ එකඟතාවය අනුව, අද දින සභා රැස්වීමෙන් පසුව මෙම සභාව 2014 මැයි මස 20 වන දින පෙ.ව. 09.30 ට රැස්වන බවත්, ඒ නිසා 2014 මැයි මස 13 වන දින සභා රැස්වීම නොපැවැත්වෙන දිනයක් බවත් ගරු මන්ත්‍රීතුමන්ලාට කාරුණිකව දැනුම් දෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

මෙතුමා කිව්වා, දාහතර කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා 20 වන දින -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, හිටපු විපක්ෂ නායකතුමාට ඇහෙනවා ටිකක් අඩුයි. මම හිතන්නේ පෙනෙනවත් අඩුයි. අපි දෙදෙනාම තරුණ අය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනවශ්‍ය ප්‍රශ්න අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අද දින බස්නාහිර පළාත් සභාවේ සිය ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කරන ලද ගරු ආණ්ඩුකාරතුමාට අපි ස්තූතිවන්ත වෙන්නට ඕනෑ. විශේෂයෙන් එතුමා අද මේ අවස්ථාවට සහභාගිවීම පිළිබඳව. ඒ වාගේම ගරු ප්‍රධාන අමාත්‍යතුමා ඇතුළු අමාත්‍යවරුන්ටත්, විපක්ෂ නායකතුමා ඇතුළු විපක්ෂයේ සංවිධායකතුමා ඇතුළු ආණ්ඩු පක්ෂයේ, විපක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මන්ත්‍රීතුමියන්ලාට ස්තූතිවන්ත වෙනවා. අද දින නියමිත වේලාවටම සභා රැස්වීමට සහභාගිවීම පිළිබඳව. ඉදිරියේදීත් ඔබතුමන්ලා නියමිත වේලාවට සභා රැස්වීමට සහභාගි වෙයි කියලා මගේ ලොකු බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ එක්කම අපේ ප්‍රධාන ලේකම්තුමිය, ආණ්ඩුකාර ලේකම්තුමා ඇතුළු අමාත්‍යාංශ ලේකම්වරුන්ට මම විශේෂයෙන්ම ස්තූතිවන්ත වෙනවා. ඒ වාගේම අද දින මාධ්‍ය ආවරණයට සම්බන්ධ වුණු, අපට මාධ්‍ය අනුග්‍රහය ලබා දෙන අපේ හිතවත් සියලුම මාධ්‍ය මිතුරු මිතුරියන්ට මම ස්තූතිවන්ත වෙනවා. අද දිනත් මෙම ප්‍රතිපත්ති ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ සහා රැස්වීම ආවරණය කිරීම පිළිබඳව සියලුම මාධ්‍ය ආයතනවලට මගෙත් ස්තූතිය සහ ගෞරවය පුද කර සිටිනවා. ඒ වාගේම අද දින මෙම වාම් අභිමානවත් උත්සවය සාර්ථකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව සභා ලේකම් හේමන්ත සමරකෝන් මැතිතුමා ඇතුළු සභා ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් මගේ ගෞරවය සහ ස්තූතිය පුද කර සිටිනවා. සහභාගි වුණු සියලුම අපේ ආරාධිත අමුත්තන්, සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ටත් ස්තූතිවන්ත වෙනවා.

# කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මෙම සභාව කල් තැබිය යුතු යැයි"* යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව පූ.භා. 11.46 ට, 2014 මැයි මස 20 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 11.46 a.m till 9.30 a.m. on 20.05.2014*